මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක : PE/2024/23** **2024.10.16**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14

### ඡන්ද විමසීම් ක්‍රියාවලියට අදාළව ප්‍රචාරය වන වගකීමෙන් තොර අසත්‍ය ප්‍රවෘත්ති සම්බන්ධ පැහැදිළි කිරීමයි

පාර්ලිමේන්තු මැතිවරණය නිදහස්, සාධාරණ හා විශ්වසනීයභාවයෙන් යුතුව පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් මේ වන විට සියලු විධිවිධාන යොදා ඇති අතර එයට අදාළව මැතිවරණ කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිතව කළ යුතු කාර්යයන් පිළිබඳ චක්‍රලේඛ, උපදෙස්, නියෝග නිකුත් කොට ඇති අතර ඒ සම්බන්ධයෙන් ජනමාධ්‍ය හරහා මහජනතාවද දැනුම්වත් කිරීමට පියවර ගෙන ඇත.

විශේෂයෙන්ම ඡන්ද විමසීම තරග කරන සියලුම අපේක්ෂකයින් වෙත ස්වකීය මනාප අංක මේ වන විටත් නිකුත් කොට ඇති අතර අපේක්ෂකයන් විසින් එම අංක යොදාගනිමින් ඡන්ද ප්‍රචාරක කටයුතු ආරම්භ කොට ඇති බව නිරීක්ෂණය වේ.

තවද ඡන්ද ප්‍රචාරක කටයුතුවලට අදාළ නිවේදිත මැතිවරණ කාර්යාල ආරම්භ කිරීමට අදාළව මැතිවරණ කොමිෂන් සභාවේ අංක EC/EDR/PE/2024/13 හා PE/2024/05 දරන චක්‍රලේඛය නාමයෝජනා කාලසීමාව ආරම්භයට පෙර එනම් 2024.10.03 දින නිකුත් කොට ඇති අතර එම චක්‍රලේඛය පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරන සියලුම දේශපාලන පක්ෂ / ස්වාධීන කණ්ඩායම් වෙත ලබා දී ඇත. එම චක්‍රලේඛයේ පිටපත් සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්, නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්, පොලිස්පති සහ සියලුම මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වෙත මෙන්ම මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට ද උඩුගත කොට ඇත.

එසේ වුවද විවිධ පුද්ගලයන් හා සංවිධාන විසින් මැතිවරණ නීති බලාත්මක කිරීම, ප්‍රචාරණ කටයුතු හා මැතිවරණ කොමිෂන් සභාවේ වෙනත් පරිපාලනමය කාර්යයන් සම්බන්ධයෙන් කරනු ලබන ප්‍රකාශ හා මත මාධ්‍ය මඟින් ප්‍රචාරය වන බව නිරීක්ෂණය වන අතර එවැනි පුද්ගලයින් හා සංවිධාන විසින් කරනු ලබන ප්‍රකාශ, මත හා දැනුම්වත් කිරීම් ව්‍යාජ හා පදනම් විරහිත හෙයින් ඒවා නොසලකා හරින මෙන් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)